# ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

# පුරප්පාඩු

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව රජයේ රෝහල් සඳහා අවශ්‍ය ඖෂධ හා ශල්‍ය උපකරණ ආනයනය කරන එකම රාජ්‍ය ආයතනය වන අතර, පුද්ගලික අංශය සඳහා ඖෂධ ආනයනය කර බෙදාහැරීමේ ප්‍රමුඛතම ආයතනය ද වේ.

අප ආයතනය පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා පහත පරිදි සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## තාක්ෂණික ඇගයීම් නිලධාරී

## (JM 1.1) II වන ශ්‍රේණිය (කොන්ත්‍රාත් පදනම මත) - පුරප්පාඩු 03

**සුදුසුකම්**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් රසායන විද්‍යා විෂය ඇතුළත් විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය/රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධියක් ලබා තිබීම හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විශ්වවිද්‍යාලයකින් ලබාගත් වෙනත් ඒ හා සමාන සුදුසුකම් ලබා තිබීම.

**සහ**

(ආ) පරිගණක සාක්ෂරතාවය

**සහ**

(ඇ) රජයේ / රාජ්‍ය සංස්ථා / මණ්ඩල / ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ටෙන්ඩර් ප්‍රසම්පාදනය/තාක්ෂණික ඇගයීම් ක්ෂේත්‍රවලට අදාළව අවම වශයෙන් වසරක සේවා පළපුරුද්ද.

**වැටුප් පරිමාණය** : රු. 53,250/-, 945/-X10, 1,420/- X18 = 88,260/- (දළ මාසික වේතනය රු. 145,842/- ක් පමණ වනු ඇත)

**වයස් සීමාව** : වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා බලනොපායි.)

**ආයතනික ප්‍රතිලාභ** :

තෝරාගත් අයදුම්කරුවන් හට මාසික පැමිණීමේ දිරි දීමනාව, ලබා නොගත් නිවාඩු සඳහා මුදල් ප්‍රතිපූර්ණය, වාර්ෂික ප්‍රසාද දීමනා, සමාජයීය ප්‍රතිලාභ, වෛද්‍ය ප්‍රතිලාභ හා සේවකයා හා පවුලේ අය සඳහා රෝහල්ගත වීමේ වෛද්‍ය රක්ෂණාවරණය ඇතුළු ප්‍රතිලාභ රැසක් හිමි වේ.

අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කළ ජීව දත්ත සමග අයදුම්පතෙහි වයස, සුදුසුකම්, පුහුණුව, සේවා පළපුරුද්ද, වත්මන් තනතුර, වැටුප හා වැටුප් පරිමාණය, දරන ලද පෙර තනතුරු හා පෙර සේවා යෝජකයන්ට සම්බන්ධ වූ සහ ඉවත් වූ දිනයන් යන කරුණු ඇතුළත් කොට ජාතික හැඳුනුම්පතෙහි පිටපතක්, සහතිකවල පිටපත් සහ ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සමග යොමු කළ යුතුය. අදාල සහතිකවල පිටපත් නොමැතිව යොමු කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන බව කරුණාවෙන් සලකන්න.

අයදුම්පත් බහාලූ ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන ලද තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. රාජ්‍ය අංශයේ සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් යොමු කළ යුතුය. සියලුම අයදුම්පත් 2025.02.24 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පරිපාලන),**
**ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව,**
**"මෙහෙවර පියෙස", 16 වන මහල,**
**නො. 41, කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05.**
**දුරකථන අංකය 0112 320 356 -9**